**දිනය: හිජ්රි 1448 රබීඋල් ආඛිර් මස 07 / 2026 සැප්තම්බර් 18**
**සිකුරාදා දේශනය**

# විවාහයේ සහ දික්කසාදයේ ඇති වූ ආගන්තුක සිරිත් විරිත්

සියලු ප්‍රශංසා ශ්‍රේෂ්ඨ වූ අල්-කුර්ආනය මගින් අපව උසස් කළ, අල්කුර්නයේ පොරොන්දු සහ අවවාද හරහා අපගේ ආත්මයන් නිවැරදි කළ අල්ලාහ්ට හිමි ය. එය අභිමුඛ හෝ පසුපස කිසිදු අසත්‍යයක් පැමිණිය නොහැක, එය ප්‍රඥාවන්ත, ප්‍රශංසනීය අල්ලාහ්ගෙන් පහළ වූවකි. අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවටත්, ඔහු ඒකීය බවටත්, ඔහුට කිසිදු සහකරුවෙකු නොමැති බවටත් මම සාක්ෂි දරමි, එය සදාකාලයට ම රඳා පවතින සාක්ෂියකි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් උන්වහන්සේගේ ගැත්තා සහ දූතයා බවට මම සාක්ෂි දරමි. අල්ලාහ් නබිතුමාටත්, එතුමාගේ පවුලේ අයටත්, උතුම් බවින් සහ නිවැරදි මග පෙන්වීමෙන් යුතු සහාබාවරුන්ටත්, විනිශ්චය දිනය දක්වා බොහෝ ශාන්තිය සහ සමාධානය අත්කර දෙත්වා.

---

*"අහෝ විශ්වාස කළවුනි ! අල්ලාහ්ට බිය විය යුතු අයුරින් බිය වන්න . තවද නියත වශයෙන්ම නුඹලා මුස්ලිම්වරුන් ලෙස මිස මරණයට පත් නොවන්න".*

---

[ආල ඉම්රාන්: 102]

මුස්ලිම්වරුනි,

ඉස්ලාමීය ෂරීආව (දහම) පදනම් වී ඇති ප්‍රධානම මූලධර්මයක් වන්නේ: නීතිය පිළිපදින්නන් සඳහා ලිහිල් බව ඇති කිරීම සහ ඔවුන්ගෙන් දුෂ්කරතාවයන් ඉවත් කිරීම යි. එබැවින් මෙම ශ්‍රේෂ්ඨ මූලධර්මය තහවුරු කරමින් අල්-කුර්ආනයේ සහ සුන්නාවේ සාක්ෂි එකදිගට පැමිණ ඇත. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

---

*"අල්ලාහ් නුඹලාට පහසුව අපේක්ෂා කරයි; නුඹලාට අපහසුව අපේක්ෂා නොකරයි."*

---

[අල්-බකරඃ: 185]

තවද උන්වහන්සේ මෙසේ ද පවසයි:

---

*"තවද උන්වහන්සේ දහමෙහි නුඹලා කෙරෙහි කිසිදු අපහසුතාවයක් ඇති කළේ නැත."*

---

[අල්-හජ්: 78]

නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ මගපෙන්වීම පදනම් වූයේද මෙම මූලධර්මය මත ම ය. නබිතුමාට කරුණු දෙකක් අතරින් එකක් තෝරා ගැනීමට ලැබුණු සෑම අවස්ථාවක දී ම, එය පාපයක් නොවන තාක්, ඒ දෙකෙන් වඩාත් පහසු දේ ම තෝරා ගත්හ. මෙම මූලධර්මය සියලු නැමදුම් (ඉබාදාත්) සහ ගනුදෙනු (මුආමලාත්) සඳහා අදාළ වන්නේ නම්, පවුල් කටයුතු සඳහා එය වඩාත් සුදුසු සහ අත්‍යවශ්‍ය වේ. මන්ද පවුල යනු සමාජයේ මූලික ඒකකය යි. ෂරීආව මගින් ගෙන ආ එම ලිහිල් බව පවුල තුළට ඇතුළු වන තරමට, නිවාස ස්ථාවර

වෙයි, විවාහය පහසු වෙයි, එහි වියදම් අඩු වෙයි, තවද දික්කසාදයේ දී අයිතිවාසිකම් සුරක්ෂිත වෙයි. නමුත්, මිනිසුන් ෂරීආවේ මගපෙන්වීම වෙනුවට වෙහෙසකර සිරිත් විරිත් සහ ආගන්තුක (අලුත්) පුරුදු ආදේශ කරගන්නේ නම්, එම පහසුව දුෂ්කරතාවයක් බවට පත්වෙයි. අල්ලාහ් විසින් සැනසීම සහ ප්‍රේමය සඳහා හේතුවක් ලෙස පත් කළ දෙය, දුක් කරදර සහ ආරවුල් සඳහා දොරටුවක් බවට පත්වේ.

විශ්වාසවන්තයිනි,

ඇතැම් මිනිසුන් පාලනය වන්නේ දහමේ නීතිවලට වඩා සමාජයේ සිරිත් විරිත්වලින් වීම කණගාටුවට කරුණකි. ඇතැම් සිරිත් විරිත්, ඒවායේ ඇති අයහපත් බව සහ මගහැරීම් තිබිය දී පවා, "මිනිසුන් අතර සාමාන්‍යයෙන් සිදුවන්නේ මෙයයි" යන නිදහසට කරුණ දක්වමින් ෂරීආවේ පාඨයන්ට වඩා ඉහළින් තබා ගැනීමට පටන් ගෙන ඇත. පුදුමයකි! සත්‍යයේ මිම්ම යනු මිනිසුන් කරන දේද? අල්ලාහ් තආලා මෙසේ පවසයි:

---

*"මහපොළොවේ සිටින බහුතරයක් දෙනාට නුඹ අවනත වන්නෙහි නම් අල්ලාහ්ගේ මාර්ගයෙන් ඔවුහු නුඹව නොමඟ යවනු ඇත. ඔවුහු අනුගමනය කරනුයේ හුදු අනුමානයන් මිස වෙනකක් නො වේ. තවද ඔවුහු උපකල්පනය කරන්නන් මිස වෙනත් අය නො වෙති."*

---

[අල්-අන්ආම්: 116]

එබැවින් ඇතැම් මිනිසුන් සුන්නාවට පටහැනි වීමට බිය වෙනවාට වඩා මිනිසුන්ගේ කතාවලට බිය වීමට පටන් ගෙන ඇත. එම නිසා ඔවුන්ගෙන් කෙනෙකු මෙසේ කියයි: "මෙය අධික වියදමක්/වෙහෙසක් බව මම දනිමි, නමුත් මිනිසුන් කුමක් කියයිද?" මෙලෙස මිනිසුන් බලන ආකාරය නිවාස පාලනය කරන නීතිය බවට පත්වේ.

අබූ නුඅයිම් තුමා 'අල්-හිල්යා' හි අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් වාර්තා කරයි; ඔහු මෙසේ පැවසූහ:

---

*"නුඹලාගෙන් කිසිවෙකු 'ඉම්මඅඃ' (අනුකරණය කරන්නෙකු) නොවිය යුතුය." එවිට පිරිස: "අබූ අබ්දිර් රහ්මාන්, 'ඉම්මඅඃ' යනු කුමක්ද?" යැයි විමසූහ. ඔහු මෙසේ පැවසූහ: 'මම මිනිසුන් සමඟ සිටිමි; ඔවුහු යහමග ගියහොත් මම ද යහමග යන්නෙමි, ඔවුහු මුළා වුවහොත් මම ද මුළා වන්නෙමි.' යැයි පැවසීමයි. දැනගන්න! මිනිසුන් ප්‍රතික්ෂේප කළ ද, තමා ප්‍රතික්ෂේප නොකර සිටීමට එකිනෙකා තම මනස සූදානම් කරගත යුතු ය."*

---

විශ්වාසවන්තයිනි,

අල්ලාහ් ස්වාමිපුරුෂයා කෙරෙහි මහරය (විවාහ දීමනාව) අනිවාර්ය කර, එය බිරිඳට පමණක් හිමි පූර්ණ අයිතිවාසිකමක් බවට පත් කළේය. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

---

*"තවද නුඹලා ස්ත්‍රීන්ගේ මහරය (විවාහ දීමනාව) කැමැත්තෙන්ම පිරිනමන්න. නමුත් ඔවුන් එයින් යමක් සිතින් එකඟ වී නුඹලාට කැප කරන්නේ නම්, නුඹලා එය ප්‍රීතියෙන් හා සතුටින් අනුභව කරන්න."*

---

[අන්නිසා: 4]

එසේම, බිරිඳගේ සිත සැනසීම සහ ඇයට සතුට ළඟා කර දීම සඳහා ඇඳුම්, ආභරණ සහ සුවඳ විලවුන් වැනි කුඩා තෑගි බෝග කිහිපයක්ද මහරය සමඟ ලබා දීමට පුරුදු ව සිටියහ. අපගේ සමාජයේ එය 'දස්සා' ලෙස හැඳින්වේ. නමුත් අද වන විට එය එහි සැබෑ අරමුණෙන් බැහැර වී, අපගේ සමාජය තුළ නුසුදුසු මාවතකට යොමු වී ඇත. එහි තිබූ සරල හා තෘප්තිමත් ස්වභාවයෙන් ඉවත් වී, එය එකිනෙකා පරයා යාමේ, අහංකාරකමේ සහ ආඩම්බරයේ මාධ්‍යයක් බවට පත්ව තිබේ. එමෙන්ම එය අනවශ්‍ය බාහිර ඔපදැමීම් සහ වෙහෙසකර වියදම් සම්බන්ධයෙන් පවුල් අතර ලොකු තරඟකාරීත්වයකට දොරටු විවර කර ඇත. මෙවැනි ක්‍රියාකාරකම් මගින් සරල බව අගය කිරීම, නාස්තිය හා උද්ධච්චකම පිටුදැකීම සහ මිනිසුන් අතර කැපී පෙනීමට කරන තරඟකාරීත්වය නැවැත්වීම පිළිබඳව ෂරීආව ලබා දෙන මගපෙන්වීමට පටහැනි වේ.

ආයිෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් වාර්තා වේ, අල්ලාහ්ගේ රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ:

*"නියත වශයෙන්ම කාන්තාවකගේ මංගල්‍යයේ සුබ සංකේතයක් වන්නේ ඇගේ කථිකා කරගැනීම (විවාහ යෝජනාව) පහසු වීම, ඇගේ මහරය (ඇය ලබා ගන්නා විවාහ දීමනාව) පහසු වීම සහ ඇගේ ගර්භාෂය (දරුවන් ලැබීම) පහසු වීම යි."*

[අහ්මද්]

**විශ්වාසවන්තයිනි,**

අපගේ කාලයේ මිනිසුන්ට දැරීමට නොහැකි තරම් බරක් වී ඇති තවත් කරුණක් වන්නේ විවාහයට පෙර සහ පසුව පැවැත්වෙන උත්සව ගණනාව යි. විවාහ ගිවිසුම අත්සන් කළ සැනින්ම උත්සව එකින් එක පැමිණේ. විවිධ භෝජන සංග්‍රහයන් සහ සැමරුම් නැවත නැවතත් පවත්වනු ලැබේ. අවසානයේ විවාහය යනු එකිනෙක පිටපත්වන වියදම් මාලාවක් බවට පත්වී ඇත. මෙහි ඇති ගැටලුව සතුටු වීම හෝ ප්‍රීතිය ප්‍රකාශ කිරීම නෙවේ; මන්ද එය දහමින් අනුමත කර ඇත්තකි. නමුත් ගැටලුව ඇත්තේ අනවශ්‍ය බාහිර ඔපදැමීම, අධික ලෙස වියදම් කිරීම සහ මෙම උත්සව ඉවත් කිරීමට නොහැකි තරම් සමාජ සිරිත් විරිත් බවට පත්කර ගැනීම තුළ ය. මෙලෙස ඉස්ලාමය විසින් සරලව තිබීමට කැමැත්ත දැක්වූ සතුටුදායක අවස්ථාව, පවුල්වලට බරක් වන, තරුණයන්ගේ විවාහයන් ප්‍රමාද කරවන සහ ඔවුන්ව අනවශ්‍ය ණයගැතිභාවයකට තල්ලු කරන මූල්‍යමය බරක් බවට පත්වේ.

අනස් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් වාර්තා වේ.

*නබී (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ් (රළියල්ලාහු අන්හු) තුමාගේ ඇඳුමෙහි කහ පැහැති සුවඳ විලවුන් සලකුණක් දැක, "මෙය කුමක්ද?" යැයි අසා සිටියහ. එවිට ඔහු: "මම රටඉඳි ඇටයක බරට සමාන රන් ප්‍රමාණයකට කාන්තාවක් විවාහ කර ගත්තෙමි" යි පැවසූහ. එවිට නබිතුමාණන්: "අල්ලාහ් ඔබට අභිවෘද්ධිය ඇති කරත්වා! එළුවෙකුගෙන් හෝ (වලීමා) භෝජන සංග්‍රහයක් පවත්වන්න" යැයි පැවසූහ.*

[බුහාරි සහ මුස්ලිම්]

මම මටත් නුඹලාටත් අල්ලාහ්ගෙන් ක්ෂමාව අයැද සිටිමි. එබැවින් නුඹලාද උන්වහන්සේගෙන් ක්ෂමාව අයැද සිටින්න, නියත වශයෙන්ම උන්වහන්සේ අතිශයින් ක්ෂමා කරන්නා ද කරුණාන්විත ද වන සේක.

## දෙවන කුත්බාව (දේශනය)

අල්ලාහ්ගේ උපකාරයට උන්වහන්සේට සියලු ප්‍රශංසා හිමි වන අතර, උන්වහන්සේගේ මගපෙන්වීමට සහ අනුග්‍රහයට උන්වහන්සේට මගේ ස්තුතිය පුද කරමි. අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය උදෙසා, උන්වහන්සේ හැර වෙනත් දෙවියෙකු නොමැති බවත්, උන්වහන්සේ ඒකීය බවත්, උන්වහන්සේට කිසිදු සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අල්ලාහ්ගේ තෘප්තිය වෙත ඇරයුම් කළ ගැත්තා සහ රසූල්වරයා බවට මම සාක්ෂි දරමි. අල්ලාහ් නබිතුමාටත්, එතුමාගේ පවුලේ අයටත්, සහාබාවරුන්ටත්, එතුමාගේ සහෝදරයන්ටත් ශාන්තිය සහ සමාධානය අත්කර දෙත්වා.

අල්ලාහ්ගේ ගැත්තනි, නුඹලා අල්ලාහ්ට බිය වන්න (තක්වා ඇති කරගන්න). මන්ද උන්වහන්සේ කෙරෙහි ඇති බිය තුළ ගැත්තන්ට සතුට රඳා පවතී. තවද විනිශ්චය දිනය සඳහා රැස් කරගත හැකි හොඳම සූදානම එය යි.

---

*"විශ්වාස කළවුනි, නුඹලා අල්ලාහ්ට බිය වන්න. තවද සෑම ආත්මයක්ම තමා හෙට දිනය සඳහා (පරලොව සඳහා) පූර්වයෙන් යැවූ දේ කුමක්දැයි බලත්වා! නුඹලා අල්ලාහ්ට බිය වන්න. නියත වශයෙන්ම අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳ ව අභිඥානවන්ත ය."*

---

[අල්-හෂ්ර: 18]

මුස්ලිම්වරුනි,

මිනිසුන්ට මහත් බරක් වෙමින් විවාහය තුළට ආගන්තුක (අලුත්) සිරිත් විරිත් රිංගා ගත්තා සේ ම, දික්කසාදයේ ෂරීආ අරමුණු විකෘති කරන නවතම ක්‍රියාකාරකම්වලින් දික්කසාදය ද නිදහස් වී නොමැත. ඉස්ලාමය තුළ දික්කසාදය යනු, අවශ්‍යතාවයක දී අනුමත කර ඇති දෙයක් වුව ද, යම් දිනෙක ආදරය හා කරුණාව මත පදනම් වූ සම්බන්ධතාවයක අවසානය යි. එබැවින් ෂරීආව මගින් ගෞරවය සුරකින, අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ පළිගැනීම් මෙන්ම රිදවීම් වළක්වන ආචාරධර්මවලින් දික්කසාදය වට කර ඇත.

මෙම මාතෘකාවේ දී ඇති වූ වඩාත්ම පිළිකුල් සහගත නවතම ප්‍රවණතාවයක් වන්නේ 'දික්කසාද උත්සව' (Divorce Parties) ලෙස හැඳින්වෙන දෙය යි. වේදනාවෙන් පිරුණු, පවුලක් දෙදරා යන, සහ දරුවන්ට දැඩි ලෙස බලපෑම් ඇති කරන මොහොතක්, සැමරීමට සහ සතුට ප්‍රකාශ කිරීමට ගන්නා අවස්ථාවක් බවට පරිවර්තනය කෙරේ. මුස්ලිම් නිවසක් බිඳ වැටීම සතුටට කරුණක් මෙන් හැසිරෙති. මෙය වෙන්වීමේ දී යහපත් ලෙස කටයුතු කිරීමට අණ කරන ලද ෂරීආවේ අරමුණුවලට සම්පූර්ණයෙන්ම පටහැනි වේ. අල්ලාහ් තආලා මෙසේ පවසයි:

---

*"එබැවින් (බිරිඳව) යහපත් ලෙස තබා ගැනීම හෝ නැතහොත් ගෞරවනීය ලෙස (යහපතින්) නිදහස් කිරීම කළ යුතු ය."*

---

[අල්-බකරඃ: 229]

එබැවින් දික්කසාදය කලහකාරී උත්සව හරහා පිළිගැනීමවත්, වෛරය ඇවිලවීමට හෝ අනෙක් පාර්ශ්වයේ සිත රිදවීමට එය භාවිතා කිරීමවත් යහපත් ක්‍රියාවක් (ඉහ්සාන්) නොවේ. සැබවින්ම ජීවිතයේ මෙම පරිච්ඡේදය වසා

දැමිය යුත්තේ විනීතබවින්, රහස්‍යභාවය සුරැකීමෙන්, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙන් සහ දරුවන්ට කරුණාව දැක්වීමෙනි.

මුස්ලිම් හි ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් වාර්තා වේ, අල්ලාහ්ගේ රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ:

---

*"නියත වශයෙන්ම ඉබ්ලීස් (ෂෙයිතාන්) සිය සිංහාසනය ජලය මත පිහිටුව යි. ඉන්පසු ඔහු සිය සේනාවන් (මිනිසුන්ව නොමග යැවීම සඳහා) පිටත් කර හරියි. ඔවුන්ගෙන් ඉබ්ලීස්ට වඩාත්ම සමීපතම ස්ථානය හිමිවන්නේ මහත් විපතක්/මුළාවක් සිදු කළ තැනැත්තාට යි. ඔවුන්ගෙන් එක් අයෙකු පැමිණ: 'මම මෙසේ මෙසේ කළෙමි' යි කියයි. එවිට ඉබ්ලීස්: 'නුඹ කිසිවක් කර නැත' යැයි කියයි. ඉන්පසු තවත් අයෙකු පැමිණ: 'මම මිනිසෙකු සහ ඔහුගේ බිරිඳ අතර වෙන්වීම ඇති කරන තෙක් ඔහුව අතහැරියේ නැත' යැයි කියයි. එවිට ඉබ්ලීස් ඔහුව තමා වෙතට ළං කරගෙන: 'නුඹ කෙතරම් යහපත්ද!' යැයි පවසයි." අල්-අඃමෂ් (රහිමහුල්ලාහ්) තුමා පවසයි: "එවිට ඉබ්ලීස් ඔහුව වැළඳ ගනියි" යැයි නබිතුමා පැවසූ බව මම සිතමි.*

---

ඉබ්ලීස් ප්‍රිය කරන කරුණක් සම්බන්ධයෙන් මිනිසෙකු කෙසේනම් උත්සව පවත්වන්න ද?! මෙම සිරිත් විරිත් - අල්ලාහ්ට ප්‍රශංසා වේවා, අපගේ රටේ නොමැති වුව ද - ඇතැම් ඉස්ලාමීය සමාජවල මතු වී ඇති අතර, සමාජ මාධ්‍ය හරහා ඒවා ප්‍රචාරය කරනු ලැබේ.

භාග්‍යමත් පිරිස,

නියත වශයෙන්ම විවාහය සහ දික්කසාදය යනු ජීවිතයේ ප්‍රධානතම කටයුතු අතරින් කිහිපයකි. එබැවින් ඉස්ලාමය ඒවා හිතුමනාපයට හෝ වෙනස් වන සිරිත් විරිත්වලට අතහැරියේ නැත. ඒ වෙනුවට දහම සුරකින, පවුල ආරක්ෂා කරන සහ යහපත සළසන නීතිරීතිවලින් ඒවා වට කළේය. මිනිසුන්ගේ සිරිත් විරිත් අතුරින් ෂරීආවට එකඟ වන දේ අගය කළ යුතු අතර, අල්ලාහ්ගේ නීතියට සහ උන්වහන්සේගේ රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ මගපෙන්වීමට පටහැනි වන දේ - පරම්පරාවෙන් පරම්පරාවට මිනිසුන් පිළිගත්ත ද - කිසිදු ගෞරවයකට හිමිකම් නො කියයි.

එබැවින් නුඹලාගේ තරුණයන්ට බරක් නොවී, ඔවුන්ට ගෞරවනීය හා පවිත්‍ර ජීවිතයක් ගත කිරීමට මාවත පහසු කර දෙන්න. අල්ලාහ් ඔවුන්ට පවරා නොමැති (අනවශ්‍ය) වියදම් ඔවුන් මත පටවන්න එපා. යම් හෙයකින් දික්කසාදයක් සිදු වුවහොත්, එය රිදවීමෙන් හෝ පළිගැනීමෙන් තොරව යහපත් ලෙස (ඉහ්සාන්) සිදු විය යුතු ය. තවද අඹුසැමියන්ගේ තේමා පාඨය විය යුත්තේ අල්ලාහ් තආලාගේ මෙම ප්‍රකාශය යි:

---

***"තවද නුඹලා අතර ඇති මහිමය අමතක නොකරන්න."***

---

[අල්-බකරඃ: 237]

අපි අල්ලාහ්ගෙන් මුස්ලිම්වරුන්ගේ නිවාස යහපත් කරන ලෙසත්, අඹුසැමියන්ගේ සිත් තුළ ආදරය හා එකමුතුකම ඇති කරන ලෙසත් ඉල්ලා සිටිමු. අල්ලාහ් දෙවියනි, භාරදූර වගකීම් දැරීමට අපට උපකාර කරනු මැනව, තවද වංචනිකත්වයෙන් හා විශ්වාසභංගයෙන් අපව ආරක්ෂා කරනු මැනව. අල්ලාහ් දෙවියනි, ඔබගේ

හරාම් (තහනම්) දේවලින් මිදී ඔබගේ හලාල් (අනුමත) දේවලින් සෑහීමට පත්වීමට අපට ප්‍රමාණවත් කරනු මැනව, තවද ඔබගේ අනුග්‍රහයෙන් ඔබ හැර අන් කිසිවෙකුගෙන් යැපෙන්නේ නැති පරිදි අප ව පොහොසත් කරනු මැනව. අල්ලාහ් දෙවියෙනි, ඊමානය (විශ්වාසය) අපට ප්‍රියජනක කර, එය අපගේ සිත් තුළ අලංකාර කරනු මැනව, තවද කුෆ්ර් (ප්‍රතික්ෂේපය), පාපය සහ අවනත නොවීම අපට අප්‍රියජනක කරනු මැනව, තවද අපව ඍජු මාර්ගය ලද්දන්ගෙන් කරනු මැනව. අල්ලාහ් දෙවියනි, ඉස්ලාමය සහ මුස්ලිම්වරුන් බලවත් කරනු මැනව, නිෆාක් (වංචාව) සහ මුනාෆික්වරුන් (වංචනිකයින්) පරාජය කරනු මැනව, තවද ඔබගේ දහමටත්, ඔබගේ ධර්ම ග්‍රන්ථයටත්, ඔබගේ නබිතුමාණන්ගේ සුන්නාවටත්, ඔබගේ විශ්වාසවන්ත ගැත්තන්ටත් ජයග්‍රහණය ලබා දෙනු මැනව. අල්ලාහ් දෙවියනි, මුස්ලිම්වරුන්ට සහ මුස්ලිම්වරියන්ට ද, විශ්වාසවන්තයින්ට සහ විශ්වාසවන්තියන්ට ද, ඔවුන්ගෙන් ජීවත්ව සිටින්නන්ට මෙන්ම මියගිය අයට ද ක්ෂමාව ලබා දෙනු මැනව. අල්ලාහ් දෙවියනි, අපගේ නායකයාට (අමීර්වරයාට) සහ ඔහුගේ ඔටුන්න හිමි කුමරුට ඔබගේ යහමගට අනුකූලව කටයුතු කිරීමට භාග්‍ය ලබා දෙනු මැනව, ඔවුන්ගේ ක්‍රියාවන් ඔබගේ අවනතභාවය සහ තෘප්තිය වෙනුවෙන් පත් කරනු මැනව, තවද මෙම රට ආරක්ෂිත, සන්සුන්, සමෘද්ධිමත්, සහනදායී, ආරක්ෂාවේ සහ ඊමානයේ දේශයක් බවටත්, අනෙකුත් සියලු මුස්ලිම් රටවල් ද එසේම පත් කරනු මැනව.

*(ආදර්ශ සිකුරාදා දේශන සම්පාදනය කිරීමේ කමිටුව)*